පිටබැද්දර ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය.
------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.168,549 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඇස්තමේන්තු සකස් කොට ගිවිසුම්ගතව ඉටු කරමින් සිටින අතරතුර අදාළ ප්‍රතිපාදන ලබා නොදෙන බව දන්වා ඇති බැවින් ඉටුකළ වැඩ කොටස් සඳහා සභා අරමුදලින් ගෙවීමට ඉකුත් වර්ෂයේ ජුනි සභා වාරයේ අනුමත කොට තිබුණි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.4,555,981ක් වූ ගිණුම් විෂයයන් 05 | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් | ඉදිරියේ දී අදාළ ශේෂ වෙනස්කම් නිවැරදි කරමි. |

| | |
|---|---|
| කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.786,100 ක අසමානතා විය. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 2,154,163 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2008 වර්ෂයේ සිට වර්ෂ ගණනාවක් තිස්සේ පවතින වටිනාකම් වන අතර ඒ සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් උප ලේඛනද නොපවතී. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (4) වගන්තිය | ආදායම් අයකිරීම සඳහා ලේකම්ගේ අවධානය යොමු වී නොතිබුණි. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | වාර්ෂික ගැසට් මඟින් ආදායම් ගැසට් කර එම ආදායම් අය කර ගැනීම සඳහා සභාවේ ඇති මානව හා භෞතික සම්පත් උපයෝගී කර ගනිමින් ආදායම් රැස්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රසමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ රු.295,522 ක කර්මාන්ත තැන්පත් ශේෂ හා රු.481,969 ක් වූ තෙමස් ඇප තැන්පත් ශේෂ නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,068,519 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,098,366 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,529,500 | 1,577,735 | 1,564,355 | 966,756 | 1,453,750 | 1,468,827 | 780,892 | 953,376 |
| කුලී | 4,343,000 | 4,571,985 | 4,033,753 | 2,177,792 | 4,981,000 | 11,176,728 | 11,199,926 | 1,639,560 |
| බලපත්‍ර ගාස්තු | 305,100 | 746,858 | 753,.858 | 71,522 | 263,100 | 387,178 | 379,178 | 78,522 |
| වෙනත් ආදායම් | 11,989,000 | 12,057,488 | 9,779,381 | 18,871,941 | 11,915,500 | 9,204,520 | 9,025,283 | 16,593,834 |
| එකතුව | 18,166,600 | 18,954,066 | 16,131,347 | 22,088,011 | 18,613,350 | 22,237,253 | 21,385,279 | 19,265,292 |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| 2010 පෙබරවාරි 28 දිනැති අංක 1824 දරන ගැසට් නිවේදනය මගින් සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 10 ක් දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශකර තිබුණද, වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. | දියුණු ප්‍රදේශ හඳුනාගෙන දේපළ සඳහා වරිපනම් බදු අයකල යුතුවේ. | වරිපනම් බදු පැනවීම සඳහා නව යෝජනා සම්මුතියක් ලබාගෙන ඇති අතර ඉදිරි ක්‍රියා මාර්ග ගනිමි. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.267,517 ක් වූ අතර, රු.31,856 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.299,373 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.13,377 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.285,996 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම කඩිනමින් අයකළ යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා කේ. පෝරම ඉදිරිපත් කරමින් අදාල ක්‍රියා මාර්ග ගෙන තිබුණි. |

### 2.2.4 වෙනත් ආදායම්

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,805,203 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,911,361 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ දඩ හා ගාස්තු මුදල් කඩිනමින් අය කළ යුතුවේ. | මුදල් ගෙන්වා ගැනීම සඳහා පළාත් සභාවේ ප්‍රධාන ලේකම් මගින් ඉල්ලීම් ඇති නමුත් ක්‍රමවත් පරිදි ප්‍රතිපූර්ණය වීම සිදු වී නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළයුතුවේ. | මේ වන විට වර්ෂයකට අදාළව තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කොට ගෙන සැලසුම් සකස් කර සහා අනුමැතිය ලබාගෙන ඇති අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 15 ක් සම්පූර්ණ කර ගැනීමට හා 10 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති අතර, මේ වන තෙක් පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. අතිරික්ත සේවක සංඛ්‍යාව ,අනියම් හා ආදේශක ලෙස සේවයේ යොදවාගෙන තිබුණි. |

(ආ) **සේවක ණය**

-------------

| | | |
|---|---|---|
| සභාවේ සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම පැහැරහැර ඇති සේවකයින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.34,850 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | සේවකයින් 08 දෙනෙකුට අදාළව අය විය යුතු රු. 34,850ක මුදල අය කර ගැනීම සඳහා ලිපි මඟින් දැනුවත් කිරීම් සිදු කර ඇති අතර,එසේ නොගෙවන්නේ නම් ඇප කරුවන් මඟින් අය කර ගැනීමට කටයුතු සිදු කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | --------------------------- |
| (අ) | අංක 1533/16 දරන හා 2008 ජනවාරි 25 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව 2019 වසර වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ආයතන සංඛ්‍යාව 26 ක් වූ අතර මෙම ආයතන මඟින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි. තවද පෙරසැරි ගාස්තු හා බලපත්‍ර ගාස්තු වශයෙන් රු.182,000 ක් අයවී නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී බලපත්‍ර ලබා නොගත් ආයතන සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමි. |
| (ආ) | අංක 2094 හා 2018ඔක්තෝබර් 19දිනැති ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව පිටබැද්දර මොරවක මාර්ගයේ අනුමැතියකින් තොරව ප්‍රදර්ශණය කර තිබූ දැන්වීම් පුවරු 13ක් සඳහා රු.35,755 ක ගාස්තු අයකර නොතිබුණි . | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2020 වර්ෂයේදී ගාස්තු නොගෙවූ ආයතන සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන තිබුණි. |